## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය නියාමක III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය නියාමක තනතුරේ පුරප්පාඩු 63 ක සංඛ්‍යාව පිරවීම සඳහා 2025/02/14 දිනට වයස අවුරුදු 18ට වැඩි සහ 30ට නොවැඩි ශ්‍රී ලාංකික පිරිමි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය 2025 වර්ෂයේ අප්‍රේල් මාසයේදී කොළඹදී පැවැත්වීමට නියමිතව ඇත.

02. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ " Our Services" යටතේ ඇති " Online Applications – Recruitment Exams / E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් බාර ගැනීම 2025 පෙබරවාරි මස 14 වැනි දින පෙ.ව. 9.00ට විවෘත වන අතර 2025 මාර්තු මස 14 වැනි දින රාත්‍රී 9.00 ට අවසන් වේ.

03. *තනතුරේ රාජකාරි ස්වභාවය* :

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය නියාමක තනතුරේ රාජකාරි කටයුතු ඉටු කරනු ලබයි. සියලුම දුම්රිය ආරක්ෂක නීති, බ්ලොක් රෙගුලාසි හා දුම්රිය උපදෙස් සංග්‍රහය පිළිපදිමින් දුම්රිය මගීන්ගේ ආරක්ෂාව තහවුරු කෙරෙන පරිදි දුම්රිය ධාවනය කිරීමේදී පවරනු ලබන රාජකාරි ලැයිස්තුවට අනුව රාජකාරි ඉටු කිරීම.

04. *වැටුප් පරිමාණය* :

(i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව, රු.34,130 – 5x495 – 5x575 – 10x720 – 10x745 – 54,130/- ක් වන අතර, රු. 34,130/-ක ආරම්භක වැටුප් තලයේ තබා ගෙවීම් කරනු ලැබේ.
(ii) මීට අමතරව රාජ්‍ය සේවකයන් සඳහා මූලික වැටුපට අමතරව ගෙවනු ලබන අනෙකුත් දීමනා සඳහා ද හිමිකම් ඇත.
(iii) අසනීප වී රෝහල් ගත වීමට සිදුවන අවස්ථාවලදී 'අග්‍රහාර' රක්ෂණාවරණය යටතේ වැය වූ මුදල ප්‍රතිපූරණය කර ගැනීමට හැකිය.
(iv) සේවා අවශ්‍යතාව අනුව නිල නිවාස ලබා ගැනීමට හිමිකම් පවතී.

05. (අ) *අධ්‍යාපන සුදුසුකම්* :

(i) සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව යන විෂයයන් දෙක සහිතව භෞතීය විද්‍යා විෂයය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස.(උ.පෙ.) විභාගය එකවර සමත් වීම.

(ii) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබීම.

(ආ) ***වෘත්තීය සුදුසුකම්***

i. මොරටුව විශ්වවිද්‍යාලයෙන් හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික හෝ විදුලි) ;

*හෝ*

ii. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික හෝ විදුලි) ;

*හෝ*

iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික හෝ විදුලි) ;

*හෝ*

iv. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික හෝ විදුලි);

*හෝ*

v. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම (යාන්ත්‍රික හෝ විදුලි);

*හෝ*

vi. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

vii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

(ඇ) ***කායික සුදුසුකම්*** :

i. සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින් ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.
ii. තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික වශයෙන් යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය,
iii. උස අවම වශයෙන් අඩි 05 අඟල් 04 ක් විය යුතු අතර ප්‍රාශ්වාසයේදී පපුව අඟල් 32 ට නොඅඩු විය යුතුය,
iv. 6'6',6'6' අක්ෂි දෘෂ්ටි පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(ඈ) ***වෙනත් සුදුසුකම්*** :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය,
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් ද යුක්ත විය යුතු ය,
(iii) අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබනුයේ පිරිමි අයදුම්කරුවන් පමණි,
(iv) සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

06. *බඳවා ගැනීමේ ක්‍රමය* :

i. ඉහත (06) දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර බඳවා ගනු ලැබේ. ඉහත පළමු ඡේදයෙහි දැක්වෙන පුරප්පාඩු පමණක් පුරවන අතර පොරොත්තු ලේඛනවල තබා බඳවා ගැනීමක් සිදු නොකරයි.

ii. විභාග අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේකෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මෙහොතේ සිට විභාගය අවසාන වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

iii. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

07. *තේරීමේ පටිපාටිය* :

ලිඛිත පරීක්ෂණයේ ලකුණු 50% ක් බැගින් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් පරීක්ෂණය සමත් වූ අය සේ සලකනු ලැබේ. ලකුණු ලබාගත් අනුපිළිවෙළ මත පෙළගස්වා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් මූලික සුදුසුකම් සපුරා ඇති අය අතුරෙන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර තෝරා ගනු ලැබේ.

08. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය නියාමක III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත ලිඛිත තරග විභාගය පිළිබඳ විස්තර :

(i) *විභාග පරිපාටිය සහ විෂයය නිර්දේශය* :

මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ. විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට 50% ලකුණු ප්‍රමාණයක් බැගින් ලබා ගත යුතුය.

1. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය
2. තාක්ෂණ දැනුම

(ii) *පරීක්ෂණ ක්‍රමය* :

| | | | |
|---|---|---|---|
| 1. | සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | කාලය පැය 01 | ලකුණු 100 |
| 2. | තාක්ෂණ දැනුම | කාලය පැය 03 | ලකුණු 100 |

*a.* *විෂය නිර්දේශය* :

විෂයය අංක 01 සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය :

අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, සාමාන්‍ය දැනුම හා බුද්ධිය පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය ගණිත ගැටළු, සාමාන්‍ය දැනීම, පරිසරය හා ආශ්‍රිත ප්‍රශ්න ඇතුළත් බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

විෂයය අංකය 02 තාක්ෂණ දැනුම :

අ.පො.ස. (උසස් පෙළ) මට්ටමින් සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව යන විෂයන් පිළිබඳ දැනුම හා මූලික තාක්ෂණය , සාමාන්‍ය යන්ත්‍ර සූත්‍ර පිළිබඳ දැනුම පරීක්ෂා කරන ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*b.* විභාග පරිපාටිය : විභාග මාධ්‍යය :

(*අ*) මෙම විභාගය සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් පැවැත්වේ.

(*ආ*) අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් පෙනී සිටිය හැකිය.

*සටහන* :

(1) අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂාවකින් පමණි.

(2) අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(3) සෑම අපේක්ෂකයකුට ම ප්‍රශ්න පත්‍ර දෙක (02) ටම පෙනී සිටිය යුතුය.

(4) වරකදී බඳවා ගනු ලබන සංඛ්‍යාව දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් තීරණය කරනු ලැබේ.

09. *අයදුම්පත සම්පූර්ණ කිරීමට උපදෙස්*:

(i) මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද අයදුම් පත්‍ර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකතන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම්

කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) විභාග ගාස්තුව රු.1200/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

සටහන :-

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තුව අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

(iii) දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

(iv) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත සුදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවනු ඇත.

11. *සේවා කොන්දේසි* :
බඳවා ගනු ලබන්නේ දුම්රිය නියාමක III වැනි ශ්‍රේණියටවන අතර, නියමිත වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරේ තබනු ලැබේ.

12. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය. දැනටමත් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක වී ඇත්නම් තවදුරටත් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හි විධිවිධාන අනුව රාජ්‍ය සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අමතරව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් වසර 05ක් තුළ ලබා ගත යුතු ය. එම ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ලැබේ.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයින් ආයතන සංග්‍රහයේ සහ මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධානවලටත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ විධිවිධානවලටත් යටත්ව කටයුතු කළ යුතුය. එමෙන්ම විටින් විට රජය විසින් නිකුත් කරන නියෝග දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටියි.

(iv) බඳවා ගනු ලබන අයදුම්කරුවන් වෙත දෙපාර්තමේන්තුව මගින් අදාළ ක්ෂේත්‍රයේ පුහුණුවක් ලබා දෙන අතර, ඉන්පසු වසර 10ක සේවා කාලයක් සඳහා ගිවිස ගත යුතුය. ගිවිසුම කඩ කළහොත් රු.1,000,000/-ක මුදලක් දෙපාර්තමේන්තුව වෙත ගෙවීමටත් අයදුම්කරු බැඳී සිටිය යුතුය.

13. මෙම නිවේදනයෙන් අනාවරණය නොවන කිසියම් කරුණක් පිළිබඳව අවසාන තීරණය ගැනීමේ බලය දුම්රිය සාමාන්‍යාධිකාරී සතුවේ. දුම්රිය නියාමක බඳවා ගැනීමේ පටිපාටියේ සියලු විධිවිධාන මෙම නිවේදනයට අදාළය.

14. මෙම නිවේදනයේ සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය නිවේදනවන අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇත්තේ නම් එවැනි විටක දී සිංහල භාෂාවෙන් වන නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතුය.

ජේ.අයි.ඩී.ජයසුන්දර,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2025 පෙබරවාරි මස 11 වැනි දින,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
අංක 355, ඕල්කට් මාවත,
කොළඹ 10.

02-124

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.